**දැනුම කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ මධ්‍යම මට්ටම - 2017**

---

දැනුම කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ 2 කොටසේ බී.3 ඡේදයේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින්ද පළාත් මට්ටමින් පළාත් සභා මගින්ද සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරන කටයුතු පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ ඇතුලත් වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල අනුව, දිවයිනේ සාමාන්‍ය අධ්‍යාපන අංශය මුහුණ දෙන අභියෝග ජයගැනීමට කෙරෙන 2012 – 2016 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහාය සැපයීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියේ මධ්‍යම මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. ශ්‍රී ලංකාවේ දැනුම පදනම් කරගත් ආර්ථික හා සමාජයීය සංවර්ධනය සඳහා පදනමක් සැපයීම උදෙසා ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනයට ප්‍රවේශය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 11,000 කට සමාන විගැහි මිලියන 64.1 ක් (එජඩො මිලියන 100) වේ. ඉන් සියයට 70 සිට සියයට 80 දක්වා අරමුදල් පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන්කර තිබූ අතර, ශේෂය අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන්කර ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය. පසුව ව්‍යාපෘතිය 2018 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස

ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) මුදල් රෙගුලාසි 150 හා මහා භාණ්ඩාගාරයේ 2017 ඔක්තෝබර් 16 දිනැති අංක 258/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2017 ඔක්තෝබර් 16 දිනැති අංක 258/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල වන පරිදි 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමු උප ලේඛනයේ ශීර්ෂ අංක 126 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017 වර්ෂයට අදාල විසර්ජන ගිණුම පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර ඇති බව, ඉහත ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව මහා භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික ඇස්තමේන්තු සහ ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලබන පොත් හා වාර්තා සමඟ එකඟ වන බව,

(ආ) තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මධ්‍යම මට්ටම සඳහා මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් 2017 වර්ෂය තුල | | උපයෝජනය කළ අරමුදල් 2017 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංසං | 30 | 3,300 | 737 | 3.91 | 595.64 | 29.21 | 4,093.70 |
| | **30** | **3,300** | **737** | **3.91** | **595.64** | **29.21** | **4,093.70** |

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 – 2016 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන අනුව, ජාතික හා පළාත් පාසැල්වල තාක්‍ෂණික විද්‍යාගාර 1005 ක් ඉදිකිරීම, එම විද්‍යාගාර සඳහා විද්‍යාගාර උපකරණ ප්‍රසම්පාදනය කිරීම හා ශිෂ්‍ය කාර්ය සාධනය වැඩි දියුණු කිරීම මඟින් උසස් පෙළ විද්‍යා විෂය ධාරාව සඳහා සිසු සහභාගීත්වය වැඩි කිරීමේ අරමුණින් ගුරුවරුන් සඳහා පුහුණුවීම් ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර තිබුණු අතර එම අරමුණු සඳහා ණය මුදල් උපයෝජනය කර තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම් කාර්යයන් අවසන් කර අදාල පාසැල්වල විදුහල්පතිවරුන්ට භාරදී තිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහනේ ඇතුලත් ඉලක්කගත අනෙකුත් සංරචක වන උපකරණ සැපයීම සහ ගුරුවරුන් පුහුණු කිරීම යනාදිය සැලකිය යුතු ලෙස ලඟාකරගෙන තිබුණි.

(ආ) දිවයිනේ අධ්‍යාපන ගුණත්වය වැඩි කිරීම හා ප්‍රසිද්ධ පාසැල්වලට ඇතුලත්වීමේ තරගකාරීත්වය අඩුකිරීම සඳහා රජය විසින් ජාතික හා පළාත් පාසැල් සඳහා වෙන්කරන ලද පහසුකම් හා සම්පත් බෙදාහැරීම සමානව සිදුකර නොමැති බව 2018 ජුනි 20 දින අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කළ පාසැල් සංගණනය - 2017 වාර්තාවේ පෙන්වා දී තිබුණි. එම වාර්තාවේ අවධානයට ලක්කර ඇති කරුණුවල සාරාංශයක් පහත දැක්වේ.

i. සපයන ලද තොරතුරු අනුව, දිවයිනේ පාසැල් පද්ධතිය ජාතික පාසැල් 353 ක් ඇතුලත්ව රජයේ පාසැල් 10,194 කින් සමන්විත වූ අතර, සමාලෝචිත වර්ෂය තුල ජාතික පාසැල් තුල සිසුන් සංඛ්‍යාව 811,164 ක්ද ඇතුළත්ව සම්පූර්ණ ශිෂ්‍ය ජනගහනය මිලියන 4.16 කින් සමන්විත විය. එම නිසා, රජයේ මුළු පාසැල් වලින් ජාතික පාසැල් ප්‍රතිශතය සියයට 3.5 ක් වූ අතර ප්‍රසිද්ධිය හා පිළිගැනීම නිසා රජයේ පාසැල්වල ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 19.50 ක් විය. තවද, මුළු පාසැල්වලින් සියයට 50.63 ක් නියෝජනය වන පාසැල් 5,161 ක ශිෂ්‍ය ජනගහනය සිසුන් 200 කට වඩා අඩු මට්ටමක පැවති අතර, ග්‍රාමීය ප්‍රදේශවල පාසැල් අඩු ශිෂ්‍ය සංඛ්‍යාවකින් පවත්වාගෙන යන බව පෙනී යයි. තවද, රජයේ පාසැල්වල මුළු ගුරුවරු ජනගහනය 241,591 ක් වූ අතර ඉන් පිරිමි ගුරුවරු ප්‍රතිශතය සියයට 26.75 ක් නියෝජනය කරන 64,635 දෙනෙකු පමණක් වූ අතර, එය ගුරු වෘතියේ ආධිපත්‍ය කාන්තා ගුරුවරුන් බව පැහැදිලි විය.

ii. සංගණනය අනුව, අධ්‍යාපන ප්‍රයෝජනය සඳහා මුළු පාසැල් සංඛ්‍යාවෙන් සියයට 45 ක් නියෝජනය කරන පාසැල් 4,551 කට පරිගණක සපයා නොතිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට වයඹ පළාතේ සිසුන් සියයට 49 ක් සතුව පරිගණක පහසුකම් නොතිබුණි.

### 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

2017 දෙසැම්බර් 29 දින පාසැල් පදනම් ඉගෙනීම් වැඩිදියුණු කිරීමේ වැඩ සටහනේ කාර්යයන් ක්‍රියාත්මක කරගෙන යාමට දීප ව්‍යාප්ත ජාතික පාසැල් 353 ක විදුහල්පතිවරුන්ට රු.මිලියන 161 ක් ප්‍රදානයක් වශයෙන් ව්‍යාපෘතිය විසින් ප්‍රේෂණය කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ප්‍රදානය භාවිතා කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් වෙනමම මහ පෙන්වීම් උපදෙස්ද ඔවුන් වෙත ලබා දී තිබුණි. කෙසේ වුවද, මෙම ප්‍රදාන මුදල් භාවිතා කිරීම සම්බන්ධයෙන් 2018 අප්‍රේල් 27 දින වන විටත් ප්‍රගතිය පිළිබඳ තොරතුරු රේඛීය අමාත්‍යාංශයේ ජාතික පාසැල් ශාඛාවට ලැබී නොමැති බව විගණනයේදී අනාවරණය විය.

තවද, මෙම ප්‍රදාන භාවිතා කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම නිසා නැගෙනහිර පළාතේ කල්මුනේ සහීරා විද්‍යාලය හා එරාවූර් අලිගාර් විද්‍යාලය 2018 මාර්තු 31 දින වන විටත් ප්‍රදාන මුදල් අරමුණුගත ප්‍රයෝජනය සඳහා යොදාගෙන නොමැති බව විගණන ස්ථාන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.